# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2052/3 - 2018 ජනවාරි මස 02 වැනි අඟහරුවාදා - 2018.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: MUL/LND/02/ACQ/47.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/15/2014/වීර්/236.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙයියන්දර ග්‍රාම නිලධාරී වසමට අයත් පණ්ඩිතපෝරුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි.83, අතිරේක අංක 16, පත්‍රය 12 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

**01. කැබලි අංක 106**

ඉඩමේ නම: කෝන්ගහහේන වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු. 20-40ක් පමණ වයසැති පොල් ගස් 28ක් සහ අවු. 10ක් පමණ වයසැති තේ වගාවක් සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය : රජය; (මුල් හිමිකම් පාන්නා: දෙයියන්දර, කෝන්ගහහේනවත්තෙහි පදිංචි ප්‍රේමා වීරබද්දන දිසානායක); ප්‍රමාණය: හෙක්. 0.1576.

**02. කැබලි අංක 107**

ඉඩමේ නම: කෝන්ගහහේන වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු. 20-40ක් පමණ වයසැති පොල් ගස් 15ක්, සහ කෙසෙල් වගාවක් සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය (මුල් හිමිකම් පාන්නා: දෙයියන්දර, කෝන්ගහහේනවත්තෙහි පදිංචි ප්‍රේමා වීරබද්දන දිසානායක); ප්‍රමාණය: හෙක්. 0.0882.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මාර්තු මස 28 වැනි දින පෙ.ව. 10.00ට ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 මාර්තු මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම් ,
මුලටියන.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 431


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*




ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.